# දෝෂාභියෝගය සහ විශ්වාසභංගය යෝජනාව

# ක්‍රියා පටිපාටිය සහ ක්‍රමවේදය පිළිබඳ පැහැදිලි කිරීම

**#GoHomeRajapakshas** ව්‍යාපාරය 2022 - ප්‍රශ්න සහ පිළිතුරු

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

### ජනාධිපතිවරයාට ගෙදර යන්න කියන ඉල්ලීම ව්‍යවස්ථා විරෝධීද?

නැත, ජනාධිපතිවරයාට ඉල්ලා අස්වන ලෙස ඉල්ලා සිටීම සහ ජනාධිපතිවරයාගේ තීරණ / ප්‍රතිපත්තිවලට අප්‍රසාදය පළ කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස භාවිත කිරීමකි. එබැවින්, ජනාධිපතිවරයාට "ගෙදර යන්න" කියා කරනු ලබන ඉල්ලීම් ව්‍යවස්ථා විරෝධී නොවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වැනි වගන්තිය මඟින් ජනාධිපති ධුරය පුරප්පාඩු වන කරුණු හයක් සපයයි, ඒවා නම්;

1. ජනාධිපතිවරයාගේ මරණය;
2. ඉල්ලා අස්වීම (පාර්ලිමේන්තු කථානායකවරයා වෙත ලිපියක් යොමු කිරීම);
3. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම නතර වීම;
4. ජනාධිපති ස්වකීය ධුරයේ ධුර කාලය ආරම්භ වී සති දෙකක් ඇතුළත ධුරයේ කාර්ය භාර ගැනීම හිතාමතාම පැහැර හැරීම;
5. දෝෂාභියෝගය; හෝ
6. ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම බල රහිත බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශ කිරීම.

ජනාධිපතිවරයාට 'ගෙදර යන්න' යැයි පුරවැසියන් විසින් ඉල්ලා සිටින විට ඉල්ලා අස්වීමේ තීරණය තෝරා ගැනීම ජනාධිපතිවරයාගේ බලතල තුළ හොඳින්ම පවතී.

### ජනාධිපතිවරයා ස්වකීය ඉල්ලා අස්වීම ප්‍රතික්ෂේප කළහොත්, ඔහුට එරෙහිව දෝෂාභියෝගයක් ඉදිරිපත් කළ හැකිද?

දෝෂාභියෝග ක්‍රියාවලිය වූ කලී ජනාධිපතිවරයා සම්බන්ධයෙන් වැරදි නිවැරදි විමසීමට ඇති ප්‍රජාතන්ත්‍රවාදී පරීක්ෂණයක් වන අතර, ජනාධිපතිවරයකු ඉවත් කිරීමේ ක්‍රියාවලියක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථාව ඉන් සලසයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38(2) ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයාට දෝෂාභියෝගයක් ගෙන ඒම සඳහා වූ ක්‍රියා පටිපාටිය සඳහන් කර ඇති අතර, මෙම ක්‍රියාවලිය ඉතා දුෂ්කර බවත්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර වසර 45කට ආසන්න කාලයක් ගතව ඇතත් මේ වන තෙක් ශ්‍රී ලංකාව කිසි දිනෙක ජනාධිපතිවරයෙකුට දෝෂාභියෝගයක් ඉදිරිපත් කර නොමැත. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය යථාර්ථය සලකා බැලීමේදී ඇති විශාලතම අභියෝගයක් නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් 2/3 ක් තුන් වරක් එවන් දෝෂාභියෝගයකට සහාය දිය යුතුව ඇති බවයි.

සාර්ථක දෝෂාභියෝග ක්‍රියාවලියක් සිදු කිරීමට පියවර කිහිපයක් ඇත-

- පියවර 1 - යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමක්

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් කථානායකවරයාට යෝජනා සම්මතයක් ඉදිරිපත් කරමින් ජනාධිපතිවරයාගේ මානසික හෝ ශාරීරික අබලතාව හේතුවෙන් ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට නියත වශයෙන්ම නොහැකි බවට චෝදනා කිරීම හෝ ජනාධිපතිවරයා පහතින් සඳහන් යම් වරදකට වැරදිකරු වී ඇති බවට එකී යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමේ පෙන්වා දීම:

1. චේතනාන්විතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම,
2. රාජ්‍යද්‍රෝහී වීම,
3. අල්ලස,
4. ස්වකීය ධුරයේ බලතල අයුතු අන්දමින් පාවිච්චි කිරීම හා සම්බන්ධ විෂමාචාරය හෝ දූෂණය,
5. යම් නීතියක් යටතේ චරිත දූෂණය හා සම්බන්ධ වන වරදක්.

- පියවර 2 - යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

කථානායකවරයා විසින් එවන් යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීම භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම කළ යුත්තේ පහත කරුණු සපුරලා ඇත්නම් පමණි;

එයට අවම වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් 2/3 ක් අත්සන් කර ඇත්නම් (මෙයින් අදහස් වන්නේ 225 න් මන්ත්‍රීවරුන් 150 ක් යෝජනාවට අත්සන් කළ යුතු බවයි); හෝ

එයට අවම වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අඩක් අත්සන් කර ඇති අතර එම චෝදනා විමර්ශනය කළ යුතු බවට **කථානායකවරයා සෑහීමකට පත්වේනම් ය.**

- පියවර 3 - යෝජනාව සම්මත කිරීම

යෝජනාව ඉදිරියට ගෙන යාමට නම් අවම වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් 2/3ක් විසින් සම්මත කළ යුතුය.

- පියවර 4 - ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීම

එම යෝජනාව සම්මත වුවහොත් කථානායකවරයා විසින් එම යෝජනා සම්මතය සලකා බැලීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවිය යුතුය. අධිකරණය විසින් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර, එහිදී ජනාධිපතිවරයාට ද ඔහු විසින්ම හෝ ඔහුව නියෝජනය කරනු ලබන නීතිඥයෙකු හරහා කරුණු දැක්වීමට අවසර ඇත. එවිට, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනාධිපතිවරයාට මානසික හෝ කායික දුර්වලතාවක් හේතුවෙන් ස්වකීය ධූරයේ කටයුතු නියත වශයෙන්ම ඉටුකිරීමට නොහැකිද, එසේත් නැතිනම් අදාළ යෝජනා සම්මතයේ දක්වා ඇති යම් වරදකට ජනාධිපතිවරයා වැරදිකරු වී තිබේද යන්න තීරණය කරනු ලැබේ. ශ්‍රේෂ්ඨාධිකරණය ස්වකීය තීන්දුවට හේතු ඇතුළත් වාර්තාවක් සකස් කළ යුතු අතර එය පාර්ලිමේන්තුවට යැවිය යුතුය.

- පියවර 5 - ජනාධිපතිවරයා ඉවත් කිරීමට ඡන්දය දීම

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනාධිපතිවරයාට නියත වශයෙන් ස්වකීය ධූරය දැරීමට හැකියාවක් නොමැති බව හඳුනාගෙන තිබේ නම්, හෝ යෝජනාවේ අඩංගු එක් ක්‍රියාවකට වරදකරු වී ඇත්නම්, නැවත වරක් පාර්ලිමේන්තුව විසින් එකී යෝජනාවට ඡන්දය ලබා දිය යුතුය. නැවතත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් 2/3 ක් යෝජනාවට ඡන්දය දිය යුතුය. ශ්‍රේෂ්ඨාධිකරණය එවැනි තත්ත්වයක් හෝ වරදක් ඇති බවට නිගමනය නොකළහොත් අදාළ ක්‍රියාවලිය අවසන් වේ.

ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒමට හැකිවන්නේ මේ සියලු පියවර සාර්ථක වුවහොත් පමණි. ජනාධිපතිවරයෙකු දෝෂාභියෝගයකට ලක්විය හැකි වරදකට වැරදිකරු විය හැකි නමුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පක්ෂ මට්ටමින් ඡන්දය ප්‍රකාශ කිරීම වැනි දේශපාලන සාධක හේතුවෙන් දෝෂාභියෝගයක් සඳහා අවශ්‍ය මන්ත්‍රීවරුන් ඒකරාශී කර ගැනීම දුෂ්කර තත්ත්වයකට පත් කරනු ලබයි.

## ජනාධිපතිවරයා ඉල්ලා අස් වුවහොත් සිදුවන්නේ කුමක් ද?

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ධූර කාලය ඔහු තේරී පත් වූ දින සිට වසර පහක් වන අතර, ඒ අනුව වර්ෂ 2024 නොවැම්බර් දක්වා එය පවතිනු ඇත. යම් හෙයකින් ඔහු ධූරයෙන් ඉල්ලා අස්වන්නේ නම්, අදාල ඉතිරි ධූර කාලය සඳහා ජනාධිපතිවරයෙකු තෝරා ගැනීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන දක්වා ඇත. නව ජනාධිපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා ජනතාව ඡන්දය දෙන ජනාධිපතිවරණයක් මෙයට සම්බන්ධ නොවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වැනි ව්‍යවස්ථාවට අනුව, ජනාධිපතිවරයා ඉල්ලා අස්වන්නේ නම්, පාර්ලිමේන්තුව විසින් හැකි ඉක්මනින් (මාසයක් නොඉක්මවන කාල සීමාවක් ඇතුළත) ජනාධිපති ධූරයට අනුප්‍රාප්ත වීම සඳහා පාර්ලිමේන්තුව තුළ සිටින පුද්ගල මන්ත්‍රීවරයකු තෝරාගත යුතුය. ඒ සම්බන්ධයෙන් වන ඡන්දය රහස් ඡන්දයකින් සිදු කරනු ඇත. එසේම, ඒ සඳහා අදාළ අපේක්ෂකයින් ජනාධිපති ධූරය දැරීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය වන බැවින් ඒ අනුව අදාළ මන්ත්‍රීවරයා වයස අවුරුදු 30 ට අඩු අයෙකු හෝ මීට පෙර දෙවරක් ජනාධිපති ධූරය දැරූ අයෙකු විය නොහැක. මෙකී තොරා පත්කර ගැනීම සඳහා වර්ෂ 1981 අංක 2 දරණ ජනාධිපතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අදාළ වේ.

මාසයක කාලයක් නොඉක්මවිය හැකි අතුරු කාලසීමාව තුළ, අගමැතිවරයාට ජනාධිපති ලෙස ක්‍රියා කිරීමට අදාළ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇත. කෙසේ වෙතත්, අග්‍රාමාත්‍යවරයාට එය කළ නොහැකි නම්, එම කෙටි කාලය සඳහා කථානායකවරයා ජනාධිපතිවරයා ලෙස කටයුතු කළ යුතු බව එහි සඳහන් වේ.

## අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය ඉවත් කරනු ලබන්නේ කෙසේද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 49(1) ව්‍යවස්ථාවට අනුව, අග්‍රාමාත්‍යවරයා මිය ගියහොත්, ඉවත් කිරීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් ධූරය දැරීම නතර කළහොත් අමාත්‍ය මණ්ඩලය ද විසුරුවා හරින ලද බවට සැලකෙන අතර, ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගෙන් නව අගමැතිවරයෙකු සහ කැබිනට් මණ්ඩලයක් පත් කළ හැකිය. ඔහු විසින් පත් කරනු ලබන තැනැත්තා පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය දිනා ගැනීමට බොහෝ දුරට ඉඩ ප්‍රස්ථාව ඇති තැනැත්තකු විය යුතුය.

අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැකි අනෙක් ක්‍රමය නම් ආණ්ඩුවට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීමය. එසේ සම්මත වුවහොත් කැබිනට් මණ්ඩලය විසුරුවාහරින ලදැයි සැලකේ.

## විශ්වාසභංග යෝජනාවක් ක්‍රියාත්මක වන්නේ කෙසේද?

විශ්වාසභංගයක් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 49(2) ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුවකට එරෙහිව පාර්ලිමේන්තුවට ගෙන එනු ලබන යෝජනාවකි. එවන් වූ විශ්වාසභංග යෝජනාවකට බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකින් ඊට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් සම්මත වුවහොත් ආණ්ඩුවට තවදුරටත් පාර්ලිමේන්තුවේ සහයෝගය හෝ ''විශ්වාසය'' හිමි නොවේ. ආණ්ඩුවකට ඕනෑම නීතියක් සම්මත කිරීමට හෝ තීරණ ගැනීමට අවම වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් අඩකගේ හෝ සහය අවශ්‍ය වන අතර සාර්ථක විශ්වාසභංග යෝජනාවකින් පෙන්නුම් කරනු ලබන්නේ මෙම සහය ඔවුන්ට නොමැති බවයි.

පාර්ලිමේන්තුවේ ඕනෑම මන්ත්‍රීවරයකුට විශ්වාසභංග යෝජනාවක් ගෙන ආ හැකිය. එය සාර්ථක වීමට නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බහුතරයක් අදාළ යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ යුතුය.

## විශ්වාසභංග යෝජනාවක් සම්මත වුණොත් අලුත් ආණ්ඩුවක් තෝරා ගනු ලබන්නේ කෙසේද?

විශ්වාසභංගයක් සාර්ථක වුවහොත් අමාත්‍ය මණ්ඩලය විසුරුවා හැරේ. මේ අනුව, නව අගමැතිවරයෙකු සහ කැබිනට් මණ්ඩලය පත්කිරීමේ ක්‍රියාවලිය නැවත මුල සිට ක්‍රියාත්මක වනු ඇත. ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය ඇති බව සැලකෙන මන්ත්‍රීවරයකු අගමැතිවරයා වශයෙන් පත් කළ යුතු අතර, අගමැතිවරයා සමඟ සාකච්ඡා කර නව අමාත්‍ය මණ්ඩලයක් පත් කළ යුතුය.

## වර්ෂ 2020 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය හරහා ගෙන ආ ප්‍රධාන වෙනස්කම් මොනවාද?

20 වන සංශෝධනයේ හරය වූයේ ජනාධිපතිවරයා වෙත විශාල බලයක් කේන්ද්‍රගත කිරීමයි. ඇත්ත වශයෙන්ම, ව්‍යවස්ථාවන් කිහිපයක් හැර, වර්ෂ 2015 දී 19 වන සංශෝධනය සමඟ ගෙන එන ලද බොහෝ වෙනස්කම්, 20 වන සංශෝධනය මගින් අහෝසි කරන ලදී.

## විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනු ලැබිය හැක්කේ කෙසේද?

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු බවට දේශපාලනඥයින්, නීතිඥවරුන්, විද්වතුන්, ක්‍රියාකාරීන් සහ මහජනතාවගෙන් විශාල වශයෙන් ඉල්ලීම් ඉදිරිපත් වී තිබේ. ජනාධිපතිවරයා වෙත විශාල බලයක් ඒකරාශී වන සහ ආණ්ඩුවේ අනෙකුත් ආයතන වල බලය යටපත් කිරීමට ඉඩ සලසන මෙම ක්‍රමය වර්ෂ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දෙන ලදී.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පනත් කෙටුම්පත් යෝජනාවක් ඉදිරිපත් කර එය සම්මත කළ යුතුය. එවන් යෝජිත සංශෝධන සම්මත කිරීමට පෙර ගත යුතු පියවර කිහිපයක් තිබේ.

- ඕනෑම පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට දින 7කට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුතුය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(1) ව්‍යවස්ථාව).

- ඉන් අනතුරුව, එය පළමු කියවීම සඳහා පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැක.

- පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර දින 7ක් ඇතුළත ඕනෑම පුරවැසියෙකුට එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝග කළ හැකිය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වැනි ව්‍යවස්ථාව).

- එය අභියෝගයට ලක් කරන්නේ නම්, යෝජිත සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවේ පිළිගෙන ඇති කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කරනු ලබන්නේ දැයි අධිකරණය විසින් පරීක්ෂා කරනු ඇත. යෝජිත සංශෝධනයේ යම් විධිවිධාන එකක් හෝ කිහිපයක් මෙම මෙකී විධිවිධානවලින් එකක් හෝ කිහිපයක් උල්ලංඝනය කරන බවට අධිකරණය තීරණය කරනු ලබන්නේ නම්, ඊට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන මන්ත්‍රීවරුන්ගෙන් 2/3 ට අමතරව, යෝජිත සංශෝධනයට ජනමත විචාරණයකදී ජනතාවගේ ඡන්දය ප්‍රකාශ කිරීම ද අවශ්‍ය වේ.

- ජනමත විචාරණයක් අවශ්‍ය නොවන්නේ නම්, පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවැනි සහ තෙවැනි වර කියවීමට ඉදිරිපත් කෙරෙන අතර ඉන් පසුව එය පාර්ලිමේන්තුවේ 2/3ක වැඩි ඡන්දයෙන් සම්මත කළ යුතුය.

- බොහෝ පනත් කෙටුම්පත් කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආණ්ඩුවේ පනත් ලෙස හඳුන්වා දෙනු ලබන අතර, වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ද 'පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ පනත් කෙටුම්පතක්' ලෙස හඳුන්වනු ලබන පනත් කෙටුම්පතක් ගෙන ආ හැකිය. එවැනි පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ එකම ක්‍රියා පටිපාටියම අනුගමනය කරමින් සම්මත කර ගත යුතු අතර ඒ සම්බන්ධයෙන් ගනු ලැබිය යුතු අමතර පියවර ඇති නිසා පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් සම්මත වීමට ආණ්ඩුවේ පනත් කෙටුම්පතක් සම්මත වීමට යන කාලයට වඩා වැඩි කාලයක් ගත විය හැකිය.